# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,374 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

අංක 2,373 - 2024 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා ගැසට් පත්‍රයේ පළ වූ තනතුරු - ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීම - 2024

01 අංක 2088/26 දරන 2018.09.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථාවෙ හි දක්වා ඇති විධිවිධානයන්ට අනුව උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවා කොන්දේසි :*

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට ද අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට තෝරාගනු ලබන අපේක්ෂකයෙකු යටත් වන්නේය.

2.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2088/26 සහ 2018.09.11 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළවන 12.18 වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති හා/හෝ ඉදිරියේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට නියමිත අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. *වැටුප :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුරූපව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016.06.24 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 386 අනුව, උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ වැටුප් පරිමාණය

SL 1-2016 (මාසික) රු.47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 ක් වේ.
(මෙම තනතුරට හිමි ආරම්භක වැටුප SL 1-2016 වැටුප් පරිමාණයේ 08 වන පියවර වේ. ඒ අනුව ආරම්භක වැටුප රු. 56,960/- කි.) පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

04. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

05. *සුදුසුකම් :*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;

*සහ*

(ආ) 2024.02.23 දිනට වයස අවු. 30 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි වීම ;

*සහ*

(ඇ) i. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වීම ;

*හෝ*

ii. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ I ශ්‍රේණියේ වසර 02 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

*හෝ*

iii. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය I පන්තියේ වසර 03 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

*හෝ*

iv. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය II පන්තියේ වසර 04 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

*හෝ*

v. ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණිය වසර 05 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවය ස්ථිර කර ඇති අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

*හෝ*

(ඈ) අධිකරණ කළමණාකරන සහකාර සේවයේ, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ඊට සමාන්තර සේවාවක වසර 15 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් ඇති සේවයේ ස්ථිර කර ඇති නිලධරයෙකු වීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම ;

*හෝ*

(ඉ) අවුරුදු 05 කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටින නීතීඥවරයෙකු වීම.

*සටහන :-*

I. යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතීඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්ත්වයෙන් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් සේවය කරන ලද කාලපරිච්ඡේදයක් "ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි" කාලපරිච්ඡේදයක් වශයෙන් සලකනු ලැබේ.

II. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ නිරත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

III. උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 13.5 අනුව "සතුටුදායක සේවා කාලය යනු උපලේඛනගත රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම මගින් ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු/ඇය විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේ ය.

(ඊ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(උ) තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සැ.යු - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2024 පෙබරවාරි මස 23 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. මූලික සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අනුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව තනතුර සඳහා සුදුස්සෙකු තෝරාගනු ලැබේ.

07. ඉහත 05 (ඇ සහ ඈ) යටතේ වූ සුදුසුකම් මත සේවයට බඳවා ගනු ලබන නිලධරයකු පත්වීමේ දින සිට වසර එකක වැඩ බැලීමේ සේවා කාලයකට යටත් වන්නේ ය. 05 (ඉ) යටතේ වූ සුදුසුකම් මත සේවයට බඳවා ගනු ලබන නිලධරයකු පත්වීමේ දින සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය.

08. තමා වෙත පිරිනමන ලද තනතුරෙ හි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හෝ පත් කරන ලද තනතුරෙහි රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟහරින හෝ අයදුම්කරුවකුගේ පත්වීම අහෝසි කරනු ලැබීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලය ඇත.

09. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

වැදගත් යැයි සලකනු ලබන යම් කරුණක් ගැන සාවද්‍ය ප්‍රකාශයක් හෝ සත්‍ය වසන් කිරීමක් අයදුම්කරුවකු සිදුකල බවට හෙළිදරව් වූ අවස්ථාවක ප්‍රකාශය හෝ වසන් කිරීම හෙළිදරව් වූයේ තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් අයදුම්කරු නුසුදුස්සකු බවට පත් කිරීමටත්, තෝරාගැනීමෙන් පසු නම් සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමටත් යටත් වනු ඇත.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) අයදුම්පත්‍ර ගාස්තුව රු.500/-කි. මෙම මුදල "අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්" නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් අංක 297100199025039 ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්කරුගේ නම ලිපිනය ලියන ලද 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග ලියාපදිංචි තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට ලැබීමට සැලැස්වීමෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාරදීමෙන් අයදුම්පත ලබාගත හැකිය. මුදල් ගෙවීම සඳහා අදාළ ලදුපත සම්පූර්ණ කිරීමේ දී ලදුපතේ අදාළ ස්ථානයේ අයදුම්කරුගේ නම සහ ලිපිනය සටහන් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, **2024 මාර්තු මස 25 දින හෝ ඊට පෙර ලැබෙන පිණිස** ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත පෞද්ගලිකව පැමිණ අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

11. (අ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

12. මෙහි ඉහත 01 සිට 11 දක්වා ඡේද/වගන්තීන්වල විධිවිධාන සළසා නොමැති කරුණක් වෙතොත් ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් තීරණය කරනු ඇත.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

02-833

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

## අංක 2,373 - 2024 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා ගැසට් පත්‍රයේ පළ වූ විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ

### සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරු තිස් හතරක් (34) සඳහා උපාධිධාරී අයදුම්කරුවන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි.

විභාගය දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවලදී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ. (නගර හා නගර අංක ඇතුළත් ලේඛනය මෙම නිවේදනය අවසානයේ ඇතුළත්ය.) විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය/නගර උපලේඛන අංක 01 ට අනුව විය යුතු අතර ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරය හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය

විභාග කොමසාරිස් ජනරාල් මගින් ලිඛිත තරග විභාගයක් පවත්වා එම විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

*තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය*

සුරාබදු ආඥාපනත , වස විෂ අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත, දුම්කොළ බදු පනතට අදාළව රාජකාරි කටයුතු ඉටුකිරීම , කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ රාජකාරි ඉටු කිරීම.

02. වැටුප් ප්‍රමාණය : RS-4-2016 රු. 37,030-24x660-52,870/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා.ප.ච.03/2016 ට අනුව)

**03. වයස් සීමාව :**

අයදුම්කරුවන් 2024.03.22 දිනට වයස අවු.21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (සුරාබදු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන උපාධිධාරීන් සඳහා වයස් සීමාවක් නැත)

"ඒ අනුව 2003.03.22 දිනට හෝ ඊට පෙර හා 1989.03.22 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

*උදා* :- 2024.03.22 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ 2003.03.22 දින හෝ ඊට පෙර හා 1989.03.22 දින හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණි.

**04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

i. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදාන ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

ii. ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන්ට අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.1. *කායික සුදුසුකම් :*

i.අවම උස (පාවහන් නොමැතිව) අඩි 5 අඟල් 06 ක් විය යුතුය. පපුවේ මිනුම් ආශ්වාස නොකොට අඟල් 33 ක් තිබිය යුතුය.
ii.උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්සර්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

4.2. *වෙනත් සුදුසුකම් :*

i.ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii.අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතාව | පැය 02 | 100 | 40 % |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40 % |

*විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. අභියෝග්‍යතාව | ඉල්ලුම්කරුගේ බුද්ධිය, තර්කනය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ගණිතය /ජිත්‍ර ගැටළු, සමාන /විරුද්ධ පද ලිවීම, වාක්‍යාංශ /වාක්‍ය සෑදීම, හිස්තැන් පිරවීම පිළිබඳ ප්‍රශ්න ද ඊට ඇතුළත් වෙනවා ඇත.) |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන හා සමාජීය සිදුවීම් පිළිබඳව තොරතුරු හා සාමාන්‍ය දැනුම මැන බැලීම |

*යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* - ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කළ හැකිය.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමා ,මූලික සුදුසුකමට අමතරව උපාධියක් සඳහා සහ ප්‍රථම උපාධියේ පන්ති සාමර්ථ්‍යය අනුව | 20 |
| 2. භාෂා හැකියාව | 10 |
| 3. ක්‍රීඩා කුසලතා<br>විවිධාකාරයේ ක්‍රීඩා සම්බන්ධයෙන් ජාතික, පළාත්,දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා පාසල් තරගවලදී දක්වන ලද වාර්තාගත දස්කම් සඳහා | 35 |
| 4. වෙනත් කුසලතා<br>විශේෂිත පුහුණු ශිෂ්‍යභට /ස්වේච්ඡා සේවය ආත්මාරක්ෂක පුහුණු සටන් ක්‍රම හෝ තාක්ෂණ පුහුණුව<br>බාහිර ක්‍රියාකාරකම් | 30 |
| 5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් | 05 |
| එකතුව | 100 |

05. සේවා කොන්දේසි :

i. රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින් වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

ii. 2310/29 හා 2022.12.14 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්යපරිපාටික රීතිවල I කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය, VII වෙනි පරිච්ඡේදය හා VIII වෙනි පරිච්ඡේදය අදාළ වේ.

iii. ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේ දැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

6. පුහුණු කාලය :
තෝරාගනු ලබන අපේක්ෂකයන්ට මාස 03 ක පුහුණුවක් ලබා දෙනු ලැබේ.මෙම කාල සීමාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් නොවන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. පුහුණු කාලය තුළදී පුහුණුවන්නන්ට රු.20,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

7. පරිවාස කාලය :
සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන්(03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ.පරිවාස කාලය අවසානයේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථිර කරනු ලැබේ.

7.1. තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / පත් කරන ලද තනතුරක් හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වරයාට බලය ඇත.

08. විභාග ගාස්තු :

මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න.

විභාග ගාස්තු රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

අයදුම්පත් භාරගැනීම 2024.02.23 දින පෙ.ව **9.00 සිට 2024.03.22 දින මධ්‍යම රාත්‍රී 12.00** තෙක් සිදු කෙරේ.

***සටහන*** :- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

09. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය.එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම,අයදුම්කරුගේ සම්පූර්ණ නම,ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත,විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාල ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව යම් සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම්පත් භාර ගන්නා දින සිට දින තුනක් දක්වා සඳහා පහසුකම් සලසා ඇත.

10. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය.එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරවසිටිය යුතුය.

11. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සියලුම අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ගුණසිරි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2024 පෙබරවාරි මස 22 වැනි දින,

**ආදර්ශ අයදුම් පත්‍රය**

**සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2023**

මාධ්‍යය :-
1.1 විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| | |
| | |

(උපලේඛනය 1 බලන්න)

1. (i) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————————————.
(ii) සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————————————.
(iii) මුලකුරු සමග නම :———————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. (i) ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———————————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.
(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————.
(iv) ආසන්නතම පොලිස් ස්ථානය :——————————.
(v) ආසන්නතම සුරාබදු ස්ථානය :———————————.
(vi) තැපැල් ලිපිනය :——————————.
(විභාග ප්‍රවේශ පත්‍ර එවීම සඳහා)

03. ස්ත්‍රී / පුරුෂභාවය :-

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ජංගම දුරකතන අංකය :

06. උපන් දිනය :

2024.03.22 දිනට වයස : අවුරුදු :————, මාස :————, දින :————.

07. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන බව :—————————.
(පරම්පරාවෙන්ද ,ලියාපදිංචි වීමෙන්ද යන වග සඳහන් කරන්න)

08. ජාතිය :——————————.

09. විවාහකද /අවිවාහකද යන වග :—————————.

10. අධ්‍යාපන සුදුසුකම් :

(i)

| *උපාධියේ නම හා වර්ෂය* | *විශ්ව විද්‍යාලය* | *වර්ෂය* | *ලබා ඇති පන්ති සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

(ii) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සාමර්ථයන්

වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *සාමර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(iii) අ.පො.ස.(උ.පෙළ) විභාගයේ සාමර්ථයන්

වර්ෂය :————.

විභාග අංකය :————.

| විෂයය | සාමර්ථ්‍යය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. දැනට කරන රැකියාවේ විස්තර :
............................................................................................................
............................................................................................................

12. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර :
............................................................................................................
............................................................................................................

13. වෙනත් විශේෂ පුහුණුවීම් පිළිබඳ විස්තර :......................................................................................
............................................................................................................

14. (i) උස : සෙ. මී. (අඩි : .............. අඟල් :............)
(ii) පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ.මී. ............... (අඟල් .............)

15. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර : .....
..........................................................................................................................

16. අයදුම්කරුගේ ප්‍රකාශය
මා විසින් මෙහි සඳහන් කරඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද, ප්‍රකාශ කරමි. අදාළ විභාග ගාස්තුව ගෙවූ බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

උපලේඛන අංක 01

| දිස්ත්‍රික්කය / නගරය | දිස්ත්‍රික් /නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| ත්‍රිකුණාමලය | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

02-776/1

---

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

සුරාබදු නියාමක / සුරාබදු නියාමිකා තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2023 වර්ෂය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක / නියාමිකා තනතුරු සඳහා පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. විභාග අයදුම්පතේ පිටපතක් අයදුම්කරු විසින් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

විභාගය දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවල දී පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ.(නගර හා නගර අංක ඇතුළත් ලේඛනය මෙම නිවේදනය අවසානයේ උපලේඛන අංක 01 ලෙස ඇතුළත්ය.) අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් කළ යුතු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය/නගර උපලේඛන අංක 01 ට අනුව විය යුතු අතර, ඉල්ලුම් කරන ලද නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරය හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය .-*

සුරාබදු නියාමක / නියාමිකා පුරප්පාඩු ගණන : -100
එයින් 10%ක් කාන්තා අයදුම්කරුවන් වෙනුවෙන් වෙන් කෙරේ.

**මූලික සුදුසුකම්ලත්** අය තරග විභාගයකට සහ ඉන් සමත් වන අය සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට ලකුණු දීමෙන් අනතුරුව බඳවා ගනු ලැබේ.

සීමිත පදනම යටතේ පිරවීමට නියමිත තනතුරු ප්‍රමාණය ඒ යටතේ පිරවීමට නොහැකි වුවහොත් එම තනතුරු ද විවෘත පදනම යටතේ තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

ලිඛිත විභාගය හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගය සමත්වන අය අතුරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබන ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළින් බඳවා ගනු ලැබේ. එම අය සම්බන්ධයෙන් රහස්‍ය වාර්තා සහ ඔවුන්ට විරුද්ධව සුරා අපරාධ හා වෙනත් අපරාධ නොමැති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව තෝරා ගනු ලබන්නන් මාස හය (06) ක පුහුණුව සඳහා බඳවා ගනු ලබන අතර, ඉන් මාස 03 ක් පුහුණු පාසලේ සහ ඉතිරි මාස තුන (03) ක්ෂේත්‍ර පුහුණුවක් වේ. එම පුහුණුව සාර්ථකව නිම කරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

02. *තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය .-*

පවරනු ලබන බල ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කරමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන සුරාබදු ආඥාපනත සහ අනෙකුත් අණ පනත්, වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ හා ආඥා පනත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත, 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත යන අණ පනත් යටතේ සුරා අපරාධවලට අදාළ තොරතුරු සොයා වාර්තා කිරීම, එවැනි වැටලීම්වලට සහාය වී අදාළ අධිකරණ කටයුතුවලට සහාය ලබාදීම, කාර්යාලයේ උපසේවා රාජකාරී ඇතුළු සුරා අපරාධ/කාර්මික වාර්තා, ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ඉදිරිපත් කිරීම සඳහා සහාය වීම. නිෂ්පාදනාගාර, ස්කාගාර හා ගුදම් රාජකාරිවල නියැලීම.

රා එකතු කිරීම් මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම හා ග්‍රහණ කටයුතුවල යෙදීම.

03. *වැටුප් පරිමාණය .-*

RS-1-2016 රු.29,540-7x300-27x370-රු. 41,630/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා .ප.ච.03/2016 ට අනුව)

04. *වයස් සීමාව .-*

අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවු.18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

"ඒ අනුව 2006.03.22 වැනි දිනට හෝ ඊට පෙර හා 1989.03.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

උදා:- 2024.03.22 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ 2006.03.22 වැනි දින හෝ ඊට පෙර හා 1989.03.22 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් .-*

i. සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සාමර්ථය සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් 6 කින් එක් වරක දී අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් සමත් වීම.

ii. පිරිමි අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් උස අඩි 5 අඟල් 06ක් තිබිය යුතුය. පපුවේ වට ප්‍රමාණය ආශ්වාස නොකර අඟල් 33 ක් ද කාන්තා අයදුම්කාරිනියන් සඳහා උස අඩි 5 අඟල් 2ක් විය යුතුය.

iii. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්ස්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

iv. අයදුම්කරුවන්/අයදුම්කාරියන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

v. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

vi. ක්‍රීඩා කුසලතා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

vii. සියලුම අයදුම්කරුවන්/අයදුම්කාරියන් අවිවාහක විය යුතුය.

ඉහත සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ වී තිබිය යුතුය.

06. *ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර:*

විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් වේ. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 1 | 100 | 40% |

*විභාගය සඳහා වන විෂය නිර්දේශය*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පදගත සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්ශනයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් හා ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය,තර්කන හැකියාව,විශ්ලේෂණාත්මක හැකියාව හා බුද්ධිය මැනීම. |
| 2. සාමාන්‍ය දැනීම | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන සමාජීය සිදුවීම් තොරතුරු පිළිබඳව සාමාන්‍ය දැනුම මැනබැලීම. |

07. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

i. *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* :- ලකුණු 20 (පශ්චාත් උපාධි/උපාධි -ලකුණු 10/ඩිප්ලෝමා - ලකුණු 07 /සහතික පත්‍ර පාඨමාලා :- ලකුණු 03 )

ii. ක්‍රීඩා කුසලතා :- (ලකුණු 09)

iii. බාලදක්ෂ/ශිෂ්‍යභට :- (ලකුණු 09)

iv. ආත්මාරක්ෂක සටන් ක්‍රම :- (ලකුණු 09)

v. සමාජ සේවා කටයුතුවලට අදාළව දැරූ නිලතල :- (ලකුණු 09)

vi. රියදුරු බලපත්‍රයක් ලබා තිබීම :- (ලකුණු 09)

vii. පරිගණක හැකියාව :- (ලකුණු 15)

viii. භාෂා හැකියාව :- (ලකුණු 15)

ix. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව:- (ලකුණු 05)

08. *අයදුම්කිරීමේ ක්‍රමය :*

අයදුම්පත් **2024.02.23 දින පෙ.ව.9.00 සිට 2024.03.22 දින මධ්‍යම රාත්‍රී 12.00** තෙක් මාර්ගගතව පමණක් භාරගනු ලැබේ. මාර්ගගත (online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා ලියාපදිංචි මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග ගාස්තු රු.600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards)
II. ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Cards)
III. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment)

**සටහන** :- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

09. *පුහුණු කාලය :*

තෝරා ගනු ලබන සෑම අපේක්ෂකයෙක් ම/අපේක්ෂිකාවක් ම පළමුව අභ්‍යාසලාභී සුරාබදු නියාමකයින්/නියාමිකාවන් වශයෙන් පත් කරනු ලබන අතර සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුරට පත් කිරීම සඳහා අවම වශයෙන් මාස 06ක අභ්‍යාසයක් ලබා ඉන් අනතුරුව නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතුය. ඉන් මාස තුන (03) ක් පුහුණු පාසලේ සහ ඉතිරි මාස තුන (03) ක්ෂේත්‍ර පුහුණුවක් වේ. එම පුහුණුව සාර්ථකව නිම කරනු ලබන්නන් සුරාබදු නියාමක තනතුරට බඳවා ගනු ලැබේ.

සුරාබදු නියාමක පුහුණුව සඳහා ප්‍රාථමික පත්වීම ලැබූ දින සිට අවම වශයෙන් මාස හය (06) ක් වූ පුහුණුවන කාලය සඳහා පුහුණු දීමනාවක් ගෙවනු ලැබේ. (පුහුණු දීමනාව අදාළ බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවන්වල දී තීරණය කෙරෙනු ඇත.)

10. *පරිවාස කාලය :*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කොට සුරාබදු නියාමක /සුරාබදු නියාමිකා තනතුරුවලට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේ දී අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථිර කරනු ලැබේ.

11. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට නියම කළ හැකිය.

12. *සේවා කොන්දේසි :*

(i) රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින් වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතුය.

(ii) 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්ය පරිපාටික රීතිවල කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය, VII වැනි පරිච්ඡේදය හා VIII වැනි පරිච්ඡේදය අදාළ වේ.

(iii) ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබේ දැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

13. තමා වෙත පිරිනමන ලද තනතුරෙ හි රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන හා පත් කරන ලද තනතුරක් හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

14. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මාර්ගගතව යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්,එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

15. විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් පත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

16. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. සියලුම අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

17. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ගුණසිරි,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2024 පෙබරවාරි මස 22 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව.

අයදුම්පතේ 1 සිට 6 දක්වා ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය සුදුසු පරිදි සෙසු පිටුවලට ද ඇතුළත් කරන්න.

**උපලේඛන අංක 01**

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික්/නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

**ආදර්ශ අයදුම්පත්‍රය**

**සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක/සුරාබදු නියාමිකා තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2023**

1. මාධ්‍යය :

1.1 විභාගයට පෙනී සිටින මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.2 විභාගයට පෙනී සිටින නගරය :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| | |
